# හරි හොඳ ලස්සන පැන්සල



නෙතුලි සෙහන්යා ගුණසේකර

# හරි හොඳ ලස්සන පැන්සල

නෙතුලි සෙහන්යා ගුණසේකර

# හරි හොඳ ලස්සන පැන්සල


## කේ. නෙතුලි සෙහන්යා ගුණසේකර


කතා

පළමු දිග හැරීම


කු/ ශාන්ත බර්නදෙත් ආදර්ශ මහා විද්‍යාලය

(ජාතික පාසල) - පොල්ගහවෙල.

5 ශ්‍රේණිය D



පලමු මුද්‍රණය - 2025.02.08

ISBN – 978-624-208-346-9

# පිදුම

අම්මයි තාත්තයි තරමටම මට ආදරේ අත්තාට....

හීනයක් හැබෑ කළ

මහමයා බාලිකා විදුහල් මෑණියන්ට ....

මට සිප්කිරි පෙවූ

කු/ශාන්ත බර්නදෙත් ආදර්ශ මහා විදුහල් මෑණියන්ට....

ආදරණීය සීයාට සහ ආච්චි අම්මාට...

තනියට ඉන්න මගේ නැන්දාට සහ මාමාට...

මගේ ආදරණීය යහළු යෙහෙළියන්ට...

මං ආදරේ... මට ආදරේ...

හැමෝටම.

# ස්තූතිය

ලස්සනම හීන පාට කරන

මගේ ආදරණීය අම්මාට...

හෙවනැල්ල වගේ පසුපස සිටින

මගේ ආදරණීය තාත්තාට...

ලස්සනට පොත සකසා දුන් ආදරණීය චතූ නැන්දාට...

පොත ලියන්නට මඟ පෙන්වාදුන්

සෙනෙවිරත්න ගුරු පියාණන්ට සහ තනුජා නැන්දාට...

වචනයකින් පවා ගුරු හරුකම් ලබාදුන්

මගේ ආදරණීයන්ට...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමයා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා, එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර, මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස, අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන“හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන්අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔයාල දන්නවාද මං ගැන?

මම අලුතින් ඉන්නකොට හරිම ලස්සනයි...





මගේ උල මොට වෙනකොට කටර්
මාමාගෙන් මාව උල් කරනවා.
කටර් මාමා මාව හපනකොට
මට ගොඩක් රිදෙනවා.



ඔයාලට ලස්සනට අකුරු ලියන්න ඕන

නිසා මම ඉවසාගෙන ඉන්නවා....



පුංචි ඔයාල මාව
වෙලාවකට
හපනවා. එතකොට
මට ගොඩක්
රිදෙනවා....

කටර් මාමාගෙන්
මාව උල් කරාට
කමක් නෑ. හැබැයි
ඔයාලා මාව
හපනකොට මට
ගොඩක් දුකයි....
ඒ නිසා මාව
හපන්න එපා....



අනික මාව බිමත් වට්ටනවා.
බිම කුණුත් තියෙනවා....



ඔයාල මාව
හපනකොට
ඔයාලගෙම බඩේ
කුණු රැඳෙනවා....
එතකොට පුංචි
ඔයාලගෙ බඩ
රිදිල රෝහල්ගත
කරන්නත්
වෙනවා....




අපි හොඳ පුරුදු
පුරුදුවෙන්න ඕන.
ඒ හින්දා මාව හපන්න
එපා....



තව එකක්..... ඔයාලට තරහ ආව වෙලාවට
මාව දෙකට කඩනවා. එතකොට මට කියාගන්න
බැරි තරම් රිදෙනවා....



මේ දවස් වල දෙමාපියන්ට, වැඩිහිටියන්ට සල්ලිත්
නැහැ. ඒ නිසා මාව හපන්න එපා.
ඔයාලට තරහ ආවම මාව දෙකට කඩන්නත් එපා....

මම කලිනුත් කීවා වගේ අපි හොඳ පුරුදු

පුරුදු වෙමු....




නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීමට සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව,

2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වූ පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම, සමාජය තුළ විවිධ ගැටලු, ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර, ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින්, දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍යය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.